ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

නො: 07, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.
இல: 07, ஹெக்டர் கொப்பெகடுவ மாவத்தை, கொழும்பு 07.
No: 07, Hector Kobbekaduwa Mawatha, Colombo 07.

ෆැක්ස් / பெக்ஸ் / Fax 2684051
ඊමේල් / ஈ-மெயில் / E-mail landcom@landcommdept.gov.

මගේ අංකය / எனது இல / MY NO: 4/1/විවිධ/සුනාමි දීමනා පත්‍ර

ඔබේ අංකය / உமது இல / YOUR NO:

දිනය / திகதி / DATE: 2010.01. 12

චක්‍රලේඛ අංක 2010/01

සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත,

සියළුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් වරුන්(අන්තර් පළාත්) වෙත.

**<u>සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූවන් නැවත පදිංචි කරවූ රජයේ ඉඩම් සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍ර ලබාදීම</u>**

සුනාමි ව්‍යසනය නිසා උන්හිටි තැන් අහිමි වූ ජනතාව වෙත රජය මගින් ලබාදී ඇති ඉඩම් හා නිවාස ලබාගත් ඉඩම් ලාභීන් එම ඉඩම් හා නිවාස නීති විරෝධී ලෙස අන්සතු කරමින් නැවතත් කලින් පදිංචිව සිටි අනතුරු දායක ස්ථානවල පදිංචි වෙමින් සිටින බවට 2010.01.07 දින ගාල්ල දිස්ත්‍රික්කයේ පැවති එම කටයුතු පිළිබඳ ප්‍රගති සමාලෝචනයකදී හෙලි විය. ඇතැම් ඉඩම් ලාභීන් නිවාස කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අත්හැර දමා වල් බිහිවීමට ඉඩ තබා ඇති බවත් හෙලි විය. එබැවින් එවැනි නිවාස/ඉඩම් ලාභීන් සම්බන්ධව පහත සඳහන් පියවර ගන්නා මෙන් උපදෙස් දෙමි.

1. පදිංචිය සඳහා ලබාදී ඇති නිවාසවල අවම වශයෙන් තම දරුවෙකු හෝ පදිංචිකර නොමැති නිවාස /ඉඩම් ඇත්නම් එවැනි නිවාස ඉඩම් සඳහා කරනු ලැබ ඇති තෝරා ගැනීම අවලංගු කිරීම

    මේ සඳහා පළමුව නිවාස ලාභියා වෙත මෙහි ඇති සු.දී.ප IV ආකෘතිය පරිදි දැන්වීමක් භාරදී දින 42කට නොඅඩු දිනයක පරීක්ෂණයකට කැඳවා පදිංචි නොවීමට තරම් සාධාරණ හේතු තිබේද යන්න ගැන ලිඛිත ප්‍රකාශ ලබාගෙන ප්‍රාදේශීය ලේකම් සෑහීමකට පත්වන්නේනම් තෝරාගැනීම අවලංගුකර ඒ බව සු.දී.ප V ආකෘතියෙන්දන්වා යවන්න. ඉන්පසු අදාල නිවාස/ඉඩම් භුක්තිය භාරනොදෙන්නේනම් සන්තකය ආපසු ගැනීම පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකර භුක්තිය භාරගෙන වෙනත් සුදුස්සෙකු වෙත එම නිවාස/ඉඩම් බෙදාදීම සඳහා ක්‍රියාකල හැකිය.

2. එසේම පදිංචි වී නොමැති මෙවැනි ඉඩම් සඳහා මගේ 2006/3 චක්‍රලේඛය අනුව දීමනාපත්‍ර ලබාදීම සඳහා සු.දී.ප/I,සු.දී.ප/II හා සු.දී.ප III ආකෘති නිර්දේශ නොකල යුතු බවද සටහන් කරගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:

01. සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත
02. සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන් වෙත

සු.දී.ප/ IV

සුනාමියෙන් අවතැන් වූවන් නැවත පදිංචි කරවීම සඳහාවූ තෝරා ගැනීම අවලංගු කිරීම සඳහා දැන්වීම

..............................................දිස්ත්‍රික්කයේ...............................................ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ...................................ග්‍රාම සේවා කොට්ඨාශයේ...................................නමැති ගමේ ..............................................දරණ මූලික පිඹුරේ ..............................................දරණ කැබැල්ල නැතහොත්,

උතුරට : ..................................................

දකුණට : ..................................................

නැගෙනහිරට : ..................................................

බස්නාහිරට : ..................................................

යන මායිම්වල පිහිටි ඉඩම සහ නිවස ලබාදීම සඳහා සුදුස්සෙකු ලෙස............................ ......................................................හි පදිංචි ......................................................වන ඔබව තෝරාගෙන ඇති අතර එම ඉඩම සහ නිවස ..............................................දින ඔබ වෙත භාරදී ඇතත් මේ දක්වා පදිංචිය නොදරණ බැවින් සහ අදාල නිවසේ පදිංචිවීම පැහැර හැර ඇති බැවින් ..............................................වන දින ......................................(වේ ලාව)ට ..............................................දී මා ඉදිරියේ පෙනී සිට ප්‍රතිවිරුද්ධ වශයෙන් ප්‍රමාණවත් හේතු ඉදිරිපත් කළහොත් මිස සුනාමියෙන් අවතැන් වූවන් නැවත පදිංචි කරවීම සඳහාවූ ඔබගේ තෝරා ගැනීම අවලංගු කිරීමට කටයුතු කරන බව මෙයින් දැන ගත යුතුය.

..................................................

ප්‍රාදේශීය ලේකම්

සු.දි.ප./V

<u>සුනාමියෙන් අවතැන්ව නැවත පදිංචි කරවීම සඳහා වූ තෝරා ගැනීම අවලංගු කිරීමේ නියමය</u>

.......................................... දරන ලිපිනයේ පදිංචි ................................................ වෙතටයි,

............................................. දිස්ත්‍රික්කයේ ................................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................................ග්‍රාම නිලධාරි වසමේ........................................ ගමේ පිහිටි අංක .................................. දරණ මූලික පිඹුරේ කැබලි අංක ........................................ දරණ ඉඩම් කැබැල්ල නැතහොත් ,

උතුරට : ..............................................................

දකුණට : ..............................................................

නැගෙනහිරට : ..............................................................

බස්නාහිරට : ..............................................................

යන මායිම් තුළ පිහිටි ඉඩම හා එහි පිහිටි නිවස සුනාමියෙන් විපතට සහන සැලසීමේ වැඩ සටහන යටතේ ඔබ වෙත භාරදී ඇතත් එම නිවස හා ඉඩම පදිංචිය සඳහා යොදා නොගැනීම පිළිබඳව මා විසින් ...................................................... දින ........................................................... ස්ථානයේදී ...................................................... වේලාවට මා ඉදිරි පිටට පැමිණ තම නිදහසට සෑහෙන පදිරි කරුණු පෙන්නුම් කර නොසිටියහොත් ඉහත කී නිවාස ඉඩම සඳහා කරනු ලැබූ තෝරා ගැනීම අවලංගු කරන බවට දන්වා ........................................ දින දැන්වීමක් නිකුත් කල බැවින්ද , එම දැන්වීමේ සඳහන් වූ දිනදීත් ,වේලාවේදී හා ස්ථානයේදී ඔබ පෙනී සිට ඉදිරිපත් කළ කරුනු පිළිගත නොහැකි බවට මට ඒත්තු ගිය බැවින්ද / පෙනී නොසිටි බැවින්ද එකී තෝරා ගැනීම අවලංගු කිරිමට මම මෙයින් නියම කරමි.

මෙහි සඳහන් දින සිට ඉහත කී නිවාස ඉඩම සියලුම බැඳීම් වලින් මිදී ආපසු ආණ්ඩුවට අයත් වන්නේය.

(අදාල නොවන වචන කපා හරින්න)

..................................................

ප්‍රාදේශීය ලේකම්